සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Provincial Department of Education - NWP**

| 06 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 21 S I,II |
|---|---|---|
| නම: ........................................ | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය පැය දෙකයි |

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න
- අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිංහල අක්ෂර මාලාවේ ඇති අක්ෂර ගණන,
    1. 54 කි. 2. 30 කි. 3. 42 කි. 4. 60 කි.

02. උත්තම පුරුෂ අතීත කාල ඒකවචන ක්‍රියා පදයකි.
    1. දුවමු. 2. දිවුවෙමි. 3. දුවහි. 4. දිවුවෙමු.

03. සඤ්ඤක අකුරු පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.
    1. ළ, ෂ, ඹ, ඟ, ඬ 2. ඟ, ඦ, ඬ, ඳ, ඹ 3. ඦ, ඬ, ශ,ඛ, ඹ 4. ඛ, ස, ළ, ඵ, ඨ

04. 'ගුරුවරු සිසුන් සමඟ දෙමාපියන් හමු වූහ.' යන වාක්‍යයේ උක්ත පදය වන්නේ,
    1. ගුරුවරු ය. 2. සිසුන් ය. 3. දෙමාපියන් ය. 4. හමුවූහ ය.

05. පිල්ලමකින් සංකේතවත් නොවන ස්වරය වන්නේ,
    1. උ ය 2. ඍ ය. 3. අ ය. 4. ඕ ය.

- අංක 6 සහ 7 ප්‍රශ්නවල දී ඇති පදවලට සමානාර්ථ දෙන පදය බැගින් ලියන්න.

06. ධවල - ..........................................................................

07. වල - ..........................................................................

- අංක 8 හා 9 ප්‍රශ්නවල දී ඇති පදවලට විරුද්ධාර්ථවත් පදයක් බැගින් තිත් ඉර මත ලියන්න.

08. පුළුල් - ..........................................................................

09. මෑත - ..........................................................................

- අංක 10 හා 11 ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු පිළිතුර තෝරන්න.

10. 1. චායාරූප 2. පරීක්සනය 3. ආර්තික 4. ණය

11. 1. අභයාසය 2. පුෂ්ඵය 3. ප්‍රතිඵල 4. පුස්ථකාලය

12. පහත වාක්‍යයේ ඇති නාම විශේෂණ පදය හා ක්‍රියා විශේෂණ පදය උපුටා තිත් ඉර මත ලියන්න.

    'මල් ඔසරිය ඇඳ සිටි කාන්තාව ශෝකයෙන් බිම බලා සිටියා ය.'

    නාම විශේෂණය ..........................................................

    ක්‍රියා විශේෂණය ..........................................................

13. "කෝදුරුවා" යන වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදි ව යෙදුණු පිළිතුර,
    1. ක්+ඕ+ද්+උ+ර්+ඇ+ව්+අ 2. ක්+ඕ+ද්+උ+ර්+ඌ+ව්+ආ
    3. ක්+ඖ+ද්+උ+ර්+අ+ව්+ආ 4. ක්+ඕ+ද්+උ+ර්+උ+ව්+ආ

- අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවලට දැක්වෙන වාක්‍යය සම්පූර්ණ කිරීමට සුදුසු උක්ත පදය හෝ අනුක්ත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

14. පාසල් දරුවෝ ............................................. පිළිගත්තෝ ය. (ගුරුදෙගුරු/ ගුරුදෙගුරුවෝ/ ගුරුදෙගුරුන්)

15. ............................................. තරගයට සහභාගි වූවේ ය. (ක්‍රීඩකයෝ/ ක්‍රීඩකයා/ ක්‍රීඩකයින්)

16. ජනාධිපතිතුමා ............................................. අගය කරන්නේ ය. (ඇමතිවරු/ ඇමතිවරුන්/ ඇමතිවරයෙක්)

- අංක 17 සිට 19 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වාක්‍ය සම්පූර්ණ කිරීමට සුදුසු ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

17. ලේඛකයා උත්සවය ............................................. (ඇමතුවෝ ය./ ඇමතුවේ ය./ ඇමතුවා ය.)

18. තාරකා පන්තිය අහස අලංකාර ............................................. (කළහ./ කළෝ ය./ කළේ ය.)

19. සොර මුළ පැන ............................................. (දුවයි./ දුවන්නේ ය./ දුවති.)

20. පහත සඳහන් වාක්‍ය නිවැරදි ව පද බෙදා සුදුසු විරාම ලකුණු යොදා නැවත තිත් ඉරි මත ලියන්න.

මේසවර්ණයෙනිමාමුළාවැකළවරදෙකිමමමහාවිහාරයනැවැතකරවන්නෙමිතෙපිමාගේවරදක්ෂමාකරවුද

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

..........................................................................................................................

(ලකුණු 2x20 - 40)

## II පත්‍රය

- ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.
- 1, 2, 3, 4 ප්‍රශ්න සඳහා අනිවාර්යයෙන් ම පිළිතුරු සැපයිය යුතු අතර 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරාගත් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.

01. පහත ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

I. ''එකඟ වෙන්ඩ ඕනෑ කාරණය මේකයි'' මෙම කොටස උපුටා ගන්නා ලද ග්‍රන්ථය කුමක් ද?
II. ''චිචෙං චුලංගෙං යමු කිරි නැනෝ'' පාඩම උපුටාගත් කෘතිය කුමක් ද?
III. ''ප්‍රබන්ධෝපදේශය'' කෘතිය රචනා කළේ කවුද?
IV. පහත අනුක්ත පදවල උක්ත පදය ලියන්න.
ගෙවිලියක ..............................................
සිංහයන් ..............................................
අප ..............................................
වෙළෙන්දා ..............................................
V. පහත අනතීත කාල ක්‍රියාපදවල අතීත කාල ක්‍රියා පදය ලියන්න.
කරයි ..............................................
බලති ..............................................
දුවමු ..............................................
බලහු ..............................................

(ලකුණු 2x5 = 10)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනාවක් ලියන්න.
I. පරිසරය ආරක්ෂා කරමු.
II. ආහාර පුරුදු හා නිරෝගීභාවය
III. ගැල්කරුවෙක් කතා කරයි.
IV. සාරධර්ම සුරකිමු.
V. ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණය

03. සමස්ත ලංකා චිත්‍ර තරගයෙන් ප්‍රථමස්ථානය හිමිකර ගත් ඔබේ පාසල් මිතුරාට සුබ පැතීම සඳහා සුදුසු සුබ පැතුම් පතක් සකස් කරන්න.

නැතහොත්

ඔබ පාසලේ පවත්වනු ලබන ''සාහිත්‍ය උත්සවය'' පිළිබඳ විස්තර කරමින් දුර බැහැර සිටින ඔබේ මිතුරාට එම උත්සවය නැරඹීමට පැමිණෙන මෙන් ඉල්ලමින් යවන ලිපිය ලියන්න.

(ලකුණු 10)

04. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

කටුගෙය, සත්වෝද්‍යානය, ළමයින්ට මෙන් වැඩිහිටියන්ට ද එක සේ ප්‍රීතියක් හා විනෝදයක් ද දෙන තැනකි. රිළවු ද වඳුරෝ ද නාගරික ළමයින්ට අපූර්ව සත්ත්වයෝ ය. වලසා, කොටියා, මුවා, කැබැල්ලෑවා යන ආදීහු ගම්බද ළමයින්ට ද අපූර්ව සත්ත්වයෝ ය. වලසාගේත් කොටියාගේත් නපුරුකම් කියමින්, කුඩා දරුවන් බිය ගැන්වීම වැඩිහිටියන්ගේ සිරිතකි. ඔවුන් ඒ සතුන්ගේ නපුරුකම් අතිශෝක්තියෙන් කියන්නේ, ළමයින් බිය ගැන්වීමෙන් ඔවුන් කැලෑ රොදවලට වැදෙනු වැළැක්වීමට ය.

I. ළමයින්ට වැඩිහිටියන්ට ප්‍රීතියක්, විනෝදයක් ගෙන දුන් ස්ථාන මොනවා ද?
II. රිළවුන් වඳුරෙන් අපූර්ව සත්ත්වයන් වූයේ කාටද?
III. ගම්බද දරුවන්ට අපූර්ව සත්ත්වයන් වූයේ කිනම් සතුන් ද?
IV. වැඩිහිටියන් කුඩා දරුවන් බිය ගැන්වූයේ කෙසේ ද?
V. වැඩිහිටියන් දරුවන් බිය ගැන්වූයේ ඇයි?

(ලකුණු 2x5=10)

- **5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**

05. පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. ''මොකද්ද කිව්වේ? ගමිං ඇවිදිල්ලා''
   (අ) මෙම ප්‍රකාශය කළේ කවුද? කාටද?
   (ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් නාට්‍ය කුමක් ද?

II. පහත කාව්‍ය ග්‍රන්ථවලට පාදක කරගත් ජාතක කතාවල නම ලියන්න.
   (අ) ගුත්තිල කාව්‍යය ..................................................
   (ආ) කාව්‍යශේඛරය ..................................................

III. ''ජයසේකර මහතා මට වඩාලාත් අමතක නොවන්නේ අන්‍යතර වූ හේතුවක් නිසා ය.'' මෙම ප්‍රකාශය උපුටාගත්,
   (අ) පාඩමේ නම ලියන්න.
   (ආ) එම පාඩමෙන් කියැවෙන්නේ කා පිළිබඳව ද?

IV. පහත ග්‍රන්ථ ලියු කතුවරුන්ගේ නම් ලියන්න.
   (අ) ප්‍රබන්ධෝපදේශය ..................................................
   (ආ) පිරුළු කතා ..................................................

V. පහත කවිය සම්පූර්ණ කරන්න.
   පුංචි ඇටේ පැළ වෙනා
   පුංචි පැළේ ගස වෙනා
   ......................................................
   ......................................................

(ලකුණු 2x5=10)

06. පහත සඳහන් ප්‍රකාශ කවුරු විසින් කා හට ප්‍රකාශ ප්‍රකාශ කරන ලද්දේ දැයි ලියන්න.

I. ''හා, හා, මම එහෙමත් කරනව ද?''
II. '''මේක එක කටකටත් මදිනේ? මොදක කරන්නේ?
III. ''දරුවෙනි, තොප කළ දේ යහපතැ''
IV. ''එසේ නම් දැන ගනුව''
V. ''මේවා ගස්වලින් කඩා ගන්නා දෙයක්දැ''

(ලකුණු 2x5=10)

07. පහත අතීත කාල වාක්‍ය අනතීකාලට හරවා ලියන්න.

I. උපාසිකාවෝ සුදුවතින් සැරසී පන්සලට ගියහ.
II. ගොවියා ලියද්දට වතුර හැරෙව්වේ ය.
III. ගුරුතුමිය පාඩම පැහැදිලි කළා ය.
IV. නිවාස ගංවතුරට ගසාගෙන ගියේ ය.
V. ගසේ අත්ත කඩා වැටුණේ ය.